නිරෝෂණී බී ඒ ඩී ටී[1], ජයසේකර එච් ඩී පී සී[2] , කුමාර ඩී එම් එස් එන්[2],
කුමාර එම් ආර් සී[2] , හේවාගමගේ පී[3] , වත්සලා විජේසිංහ[4]
[1] ආයුර්වේද වෛද්‍ය, ආයුර්වේද වෛද්‍ය[2], බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව[3], [4]නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය

**සංක්ෂිප්තය**

ත්‍රි මර්මයන් අතරින් එක් මර්මයක් වන හෘදය ආශ්‍රිතව හට ගන්නාවූ රෝග හේතුවෙන් ලෝක ජනගහණයෙන් වැඩි දෙනා ඉමහත් පීඩාවකට පත්ව ඇත. හෘද රෝග චිකිත්සාව සම්බන්ධ ව බටහිර වෛද්‍ය විද්‍යාව ද තවමත් දියුණුවෙමින් පවතන බැවින් දේශීය වෛද්‍ය ක්‍රමය තුළ ඵලදායී හා කාර්යක්‍ෂම හෘදරෝග චිකිත්සාවක් පවතී ද යන්න සොයා බැලීම ආයුර්වේද හා දේශීය වෛද්‍ය චිකිත්සකයන් ට මෙන්ම මේ පිළිබඳ ව වැඩිදුර පර්යේෂණ කරන්නන් ට වැදගත් වේ. ඒ අනුව දේශීය මුලාශ්‍ර ග්‍රන්ථවල අඩංගු හෘදරෝග චිකිත්සාව පිළිබඳව දත්ත එක් රැස්කිරීමත්, හෘදරෝග සඳහා දෝෂානුකූල ව හා ලක්‍ෂණානුකූල ව බහුලව භාවිතා වී ඇති ප්‍රතිකාර පද්ධති හඳුනාගෙන සන්සන්දනාත්මක විශ්ලේෂණයක් සිදුකිරිමත් අරමුණු කරගනිමින් නාවින්න බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද වෛද්‍ය පර්යේෂණායතන පුස්තකාලයේ හා කොළඹ විශ්වවිද්‍යාලයීය දේශීය වෛද්‍ය විද්‍යායතන පුස්තකාලයේ පැවති දේශීය වෛද්‍ය ග්‍රන්ථ පරිශීලනයෙන් ලබාගත් දැනුම මෙහි අන්තර්ගත කොට ඇත. ඒ අනුව වාතජ හෘදරෝග සඳහා ස්නේහ, ස්වේද, මෘදු වමන, විරේක, ප්‍රලේප, පරිශේක ආදියත් අභ්‍යන්තර ඖෂධ වශයෙන් මධුර, අම්ල, ලවණ රසැති හා වාත ශාමක ඖෂධ ත් තලතෙල්, ගිතෙල් ආදී ස්නිග්ධ ද්‍රව්‍ය හා මද්‍යය වර්ග අඩංගු ඖෂධ වට්ටෝරුත් අන්තර්ගත විය. පිත්තජ හෘදරෝග වලදී සිසිල් ප්‍රදේහ, පරිශේක, විරේක, ස්වේදයෙන් තොර ලඝු වමනය ආදියත් අභ්‍යන්තර වශයෙන් මධුර රසැති, ශීත හා ස්නිග්ධ ගුණැති පිත් ශාමක ඖෂධ ප්‍රයෝගය ද සිදුකර ඇත. කඵජ හෘදරෝග වලදී ස්වේද හා වමන කර්ම මෙන්ම කෂාය හා කටු රසැති තීක්‍ෂණ, උෂ්ණ ගුණැති ඖෂධ ප්‍රයෝග බහුල ය. ත්‍රිදෝෂජ හෘදරෝග වලදී කඵාධික වූ විට ලංඝනය ද පිත්තාධික, වාතාධික හා සම ත්‍රිදෝෂජ හෘදරෝගීන් ට විරේක ද ප්‍රදේහ වර්ගද කුපිත දෝෂ වල හීන, මධ්‍ය, අධික භාවය අනුව අභ්‍යන්තර ඖෂධ ප්‍රයෝග ද සිදුකල යුතු බව දක්වා ඇත. ක්‍රිමිජ හෘදරෝගයේ දී වමන, ලංඝන, ආම පාචනය, ස්නේහ කර්ම, විරේක හා ක්‍රිමිඝ්න ඖෂධ ප්‍රයෝගය ද අන්තර්ගතය. මීට අමතර ව දෝෂානුකූල ප්‍රභේදකරණයක ට අයත් නොවූ නමුත් ලක්‍ෂණානුකූල ව ප්‍රයෝගවන ඖෂධ යෝග ද සඳහන් විය. ඒ අනුව දේශීය වෛද්‍ය ග්‍රන්ථවල ඵලදායී හා කාර්‍ය්‍යක්‍ෂම හෘදරෝග චිකිත්සා ඇතුලත් වී ඇතිබව පැහැදිලිවේ.

**ප්‍රමුඛ වචනඃ** හෘදරෝග, මූලාශ්‍ර ග්‍රන්ථ, දෝෂාණුකූල, ලක්‍ෂණානුකූල, ප්‍රයෝග